# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,281 — 1965 ජනවාරි 4 වැනි සඳුදා — 1965.1.4**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වන කොටස: (I) වන ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1954 අංක 37 දරන ජාතික නිවාස පනත

**49 ඡෙදය යටතේ සහතිකය**

කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිවර, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1954 අංක 37 දරන ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. පී. ද ඉසඩ්. සිරිවර්ධන,
කම්කරු හා නිවාස ඇමති.

1965 ජනවාරි 4 දින,
කොළඹදීය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරී කොට්ඨාශයේ, තෙලවල ගම්මුලාදෑනි කොට්ඨාශයේ පිහිටි ලේඩි කැතරින් වතුයාය නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 10ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස,
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස,
දකුණට : තෙලවල පාර,
බස්නාහිරට : ගම්මුන්ගේ ඉඩම්.

1—356

---

එල්.ඩී.—බී. 16/54.

### සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

1957 අංක 60 දරන පනතින් සංශෝධිත (129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 7 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු හා නිවාස ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, (177 වැනි අධිකාරය වන) නිවාඩු ආඥපනතෙහි අර්ථානුකූලව ආණ්ඩුවේ නිවාඩු දින වන්නා වූ ද මෙයට යා කොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කොට ඇත්තා වූ ද දවස් ඉහත කී වගන්තියේ කාර්යයන් සඳහා නිවාඩු දවස් හැටියට මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ඇම්. පී. ද ඉසඩ් සිරිවර්ධන,
කම්කරු හා නිවාස ඇමති.

1965 ජනවාරි මස 2 වැනි දින,
කොළඹ දීය.

#### උපලේඛනය

1. දුරුතු පුරපසළොස්වක් පොහෝදිනය වන 1965 ජනවාරි 16 වැනි දිනය.
2. වෙසක් (අතිරේක) දිනය වන 1965 මැයි 15 වැනි දිනය.

1—357

---

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

43——ආර් 2938—6,125 (64/12)